වත්තේගම නගර සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිලිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුලි 02 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට වත්තේගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වාහන 2 ක වටිනාකම රු. 2,724,608 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ආ) සභාව සතු මහජන බැංකු ස්ථාවර තැන්පතුවේ සමාලෝචිත වර්ෂයට අදාළ පොලිය රු.153,740 ක් අඩුවෙන් හා ලැබියයුතු පොලිය රු.72,285 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඇ) කඳුරට සංවර්ධන බැංකුවේ ස්ථාවර තැන්පතුවට අදාළ පොලිය රු.99,587 ක් අඩුවෙන් හා ලැබිය යුතු පොලිය රු.167,379 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල පිරිවැය රු.136,496,486 ක් වුවත්, රු.135,076,383 ක ලෙස ගිණුමේ දැක්වීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු.1,420,103 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.3,767,622 ක් වුවත්, ලෙජරයේ අධිකතා ඌනතා ගිණුමෙහි රු.5,010,241 ක් ලෙස සටහන් කර තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයට අදාළව බිල් ඉදිරිපත් නොකරන ලද රු.38,330 ක වටිනාකමක් ණයහිමියන් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නුවරතැන්න පානීය ජල යෝජනා ක්‍රමයෙහි ණයගැති ශේෂය රු.18,000 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
-----------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.6,633,852 ක් වූ ගිණුම් විෂයන් 03 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.263,892 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 4 ක එකතු වටිනාකම රු.7,508,207 ක් වූ අතර, වර්ෂ 1-5 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.5,538,517 ක් හා වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ රු.1,969,690 ක ශේෂයක් ඊට ඇතුළත් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

-----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,467,274 ක් වූ ගනුදෙනු 3 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

--------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | වසරකට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවද, සභාව සතු වාහන 2 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) | මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන චක්‍රලේඛය | |
| | (i) 04 (1) වගන්තිය | මාසික කුලිය නියමිත දිනට නොගෙවන අවස්ථා වලදී සියයට 5 ක උපරිමයකට යටත්ව බදු මුදලක් අය කිරීම සඳහා කොන්දේසි ගිවිසුමට ඇතුළත් කල යුතු වුවද, මාසික කුලිය ප්‍රමාද වූ අවස්ථා වලදී දඩ මුදල් අය කර නොතිබුණි. |
| | (ii) 13 වන ඡේදය | සභාව සතු ගොඩනැගිලි බදු දීමේදී රජයේ ආයතන සඳහා විශේෂ අනුග්‍රහ ලබා නොදිය යුතු වුවත්, වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑම සඳහා 2010 වර්ෂයේ සිට සභාව සතු පරණ නගර සභා ගොඩනැගිල්ලේ ඉහළ මහළ පුහුණු කටයුතු සඳහා නොමිලේ ලබා දී තිබුණි. |

1.3.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

කසළ බඳුන් ව්‍යාපෘතිය සඳහා 2013 වර්ෂයේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් ලබා දී තිබුණු ප්‍රතිපාදන වලින් රු.278,350 ක් උපයෝගි කර ගනිමින් අනුමැතියකින් තොරව පරිසර අරමුදලක් ගොඩනගා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,642,099 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,490,412 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 15,316,050 | 15,927,065 | 11,814,985 | 4,112,080 | 20,055,500 | 16,647,920 | 13,354,135 | 3,293,785 |
| කුලී | 4,573,700 | 4,142,965 | 4,266,570 | (123,605) | 4,844,100 | 4,890,065 | 4,886,250 | 3,815 |
| බලපත්‍ර ගාස්තු | 700,000 | 766,220 | 765,220 | 1,000 | 760,000 | 785,450 | 782,450 | 3,000 |
| වෙනත් ආදායම් | 1,988,500 | 2,341,480 | 2,341,480 | - | 1,096,000 | 4,809,450 | 4,809,450 | - |
| | 22,578,250 | 23,177,730 | 19,188,255 | 3,989,475 | 26,755,600 | 27,132,885 | 23,832,285 | 3,300,600 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද නැවතුම් ස්ථාන ස්ථාපිත කර ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ ඇති පෞද්ගලික ආයතන, හෝටල් සහ වෙළඳසැල්වලින් කසළ බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 වරිපනම් හා බදු

--------------------

2017 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ශේෂය රු.3,158,364 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම රු.5,740,053 ක් වී තිබුණි. මෙම ශේෂයන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අයකිරීමේ ප්‍රතිශතය පිළිවෙළින් සියයට 42 හා 67 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.3,474,595 ක හිඟ ශේෂයක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂයකට වඩා වැඩි කාලයක් ඉක්මවූ රු.1,831,791 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

-----------------

2014 අගෝස්තු 02 දිනැති හා අංක 2014/5 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව බලපත්‍ර සම්බන්ධ විධිමත්ව සමීක්ෂණයක් කර ලේඛනගතකර නොතිබීමෙන් සියලුම වෙළඳ ස්ථාන සමීක්ෂණය වූ බවක් නිරීක්ෂණය නොවීය.

2.2.5 වෙනත් ආදායම්

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ජල ගාස්තු

------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ජල ගාස්තු ශේෂය රු.2,652,648 ක් වූ අතර, එම ශේෂයට වසරකට වඩා වැඩි කාලයක් ඉක්මවූ රු.2,470,140 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 vii (ඊ) වගන්තිය ප්‍රකාරව 2016 ඔක්තෝබර් 25 දින ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදනය අනුව සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරනු ලබන සියලුම දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකර සභා අරමුදලට බැර කළ යුතු වුවත්, දැන්වීම් පුවරු 11 ක් සඳහා රු.54,750 ක ගාස්තු අයකරගෙන නොතිබුණි.

(ඇ) බල ප්‍රදේශයට අයත් ත්‍රී රෝද රථ ලියාපදිංචි කර ත්‍රී රෝද රථ නැවතුම් පොළවල් විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.832,897 ක් හා මුද්දර ගාස්තු රු.2,000,000 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අනවසර ඉදිකිරීම්

----------------------

2015, 2016 සහ 2017 වසරවල අනවසර ඉදිකිරීම් 37 ක් වාර්තා වී ඇති අතර, එම ඉදිකිරීම් 15 ක් වෙනුවෙන් අනවසර නියෝග යවා තිබූ නමුත් පසු විපරම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්

------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන් තුළදී කර්තව්‍යයන් 3 ක් ආරම්භ කර එ් සඳහා රු.1,200,000 ක ප්‍රතිපාදන සලසා ගෙන ඇතත්, ව්‍යාපෘති අත්හැර දමා තිබුණි. විස්තර පහත දැක්වේ.

| | කර්තව්‍යය | ඇස්තමේන්තු පිරිවැය | නිරීක්ෂණ |
|---|---|---|---|
| | | රු. | |
| (i) | නුවරතැන්න පළමු බෝක්කුවේ සිට ඉදිරියට මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 500,000 | නව ඇස්තමේන්තුවක් සඳහා යොමුකර ඇත. |
| (ii) | බලහෙල යහලතැන්න විහාරස්ථානය නගර සභාවට පවරා ඇති ඉඩමේ ප්‍රජා ශාලාවක් ඉදිකරීම | 500,000 | ඉඩම පවරා නොදීම හේතුවෙන් අවලංගු කර තිබුණි. |
| (iii) | දුම්රියපොල ඉදිරිපස පොදු කාණුව සැකසීම | 200,000 | හේතු දක්වා නොතිබුණි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

සභා බල ප්‍රදේශයේ දිනකට එකතුවන කසළ ටොන් 1 1/2 ක් 2 ක් අතර ප්‍රමාණයකින් දිරන කසළ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව වෙත ලබාදී තිබුණි. කසළ වෙන් කර ලබා නොගැනීම හේතුවෙන් නිතිපතා කසළ වෙන් කිරීමට විශාල පිරිවැයක් දරා තිබුණි. නොදිරන කසළ සභාවට අයත් ඉඩම්වලට බැහැර කර තිබූ අතර, දුන්ඔය කුඹුර ඉඩමෙහි කසළ ඉවතලන ප්‍රදේශය පුරා දැඩි දුර්ගන්ධයක් පැතිරී තිබුණි.

(ඈ) තිරසාර සංවර්ධනය

------------------------

සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂයේදී සැලැස්මකින් තොරව කර්මාන්ත 5 ක් සඳහා රු.1,817,123 ක ප්‍රතිපාදන ඇතිකර එම වටිනාකමින් ගිණුම්වල ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. මෙම කර්මාන්ත කිසිවක් ඉටුකිරීමට කටයුතු නොකර නැවත ණයහිමියන්ගෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.

(ආ) වත්තේගම නගර ශාලාවේ පවත්වාගෙන යනු ලබන ආයුර්වේද මධ්‍යස්ථානයේ ඖෂධ නිකුත් කිරීම් කටයුතු සිදු කළද, 2017 ජූනි 01 දිනෙන් පසුව නිකුත් කරනු ලැබූ ඖෂධ බෙහෙත් තොග ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය තුළ සවිකර තිබූ ජල මනු සඳහා රු.93,226 ක මුදලක් අය කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
------------------------------------

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත
------------------------------------

අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය අතර තනතුරු 4 ක පුරප්පාඩු 8 ක් හා තනතුරු 1 ක අතිරික්තතා 3 ක් විය.

(ආ) සේවක ණය
----------------

සේවක ණය ශේෂය තුළ වෙනත් දෙපාර්තමේන්තු වෙත ස්ථානමාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුගේ වාරික වශයෙන් හෝ අයනොවන රු.412,900 ක ශේෂයක් ඇතුළත් වී තිබූ අතර, මෙම ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය
------------------------------

3.4.1 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම
--------------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පොදු වෙළඳපල කඩ කාමර දෙකක් බදු දීමට කටයුතු කර නොතිබූ අතර, වසා ඇති දොරවල් කැඩී විනාශ වී තිබුණි.

(ආ) සභාව සතු රු.17,649,179 ක් වටිනා බැකෝ යන්ත්‍රයෙන් ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම
-----------------------------------------------

වත්තේගම නගර සභාව සතු ඉඩම් 2 ක අක්කර 5 පර්චස් 47.20 ක ප්‍රමාණයක් පුද්ගලයන් 45 දෙනෙකුට අනවසරයෙන් භුක්ති විඳීමට ඉඩහැර තිබුණි.

3.4.3 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්
----------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ට්‍රැක්ටරයක්, යතුරු පැදියක්, අත්ට්‍රැක්ටර් දෙකක්, බැකෝ යන්ත්‍රයක් හා කාර් රථයක් නිෂ්කාර්යව කාර්යාල භූමියේ දමා තිබුණි.

(ආ) සභාව විසින් පවත්වාගෙන ගොස් තිබුණු පුටු නිෂ්පාදන ව්‍යාපෘතියට භාවිතා කළ රු.333,700 ක් වටිනා ලී වඩු මැෂිම හා රු.129,500 ක් වටිනා විදුලිජනක යන්ත්‍රය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

3.4.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබුණු වාහන 2 ක් 2017 ඔක්තෝබර් 31 දින දක්වාම වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 ප්‍රසම්පාදනය

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් රු.16,065,552 ක භාණ්ඩ හා සේවා මිලදීගෙන තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

කොරහිටියාව පොදු කාණුව සකස් කිරීම

2017 වර්ෂයේ සභා අරමුදල් යොදා ගනිමින් රු.196,659 ක වියදමින් නිමකර තිබූ කොරහිටියාව පොදු කාණුව 2018 අප්‍රේල් 03 දින භෞතික පරීක්ෂාවේදී එක් ප්‍රතිලාභියෙකුගේ නිවස ඉදිරිපස බැම්ම හා කාණුව නිම කිරීමට යොදවා තිබුණු බව නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) අය විෂයන් 6 ක ඇස්තමේන්තුගත රු.315,000 ක ආදායමින් කිසිදු මුදලක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වැය විෂයන් 9 කට සලසා තිබූ රු.202,000 ක ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) වැය විෂයන් 9 කට සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 සිට සියයට 96 ක් දක්වා ඉතිරි කිරීම් පැවතුණි.

4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරියෙක් පත් කර ඇතත් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | සභාව සතු දේපල බාහිර පාර්ශවයන්ට භුක්ති විඳීමට ඉඩ සැලසීම. |
| | | (ii) | නිෂ්ක්‍රීය වත්කම් ඉවත් කිරීමට කටයුතු නොකිරීම. |
| | | (iii) | ඇතැම් ස්ථාවර වත්කම් ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොතිබීම. |
| (ආ) | ගිණුම්කරණය | (i) | ස්ථාවර තැන්පතුවල පොලිය නිවැරදිව ගිණුම්ගත නොකිරීම. |
| | | (ii) | ණය හිමියන් හා ණය ගැතියන් අඩුවෙන් ගිණුම්ගත කිරීම. |
| | | (iii) | නොසැසඳුණු ගිණුම් ශේෂ පැවතීම. |
| (ඇ) | වාහන පාලනය | (i) | රියදුරු තනතුරු නොදරන පුද්ගලයන් වෙත වාහන භාර දීම. |
| | | (ii) | ඇතැම් වාහන ඌන උපයෝජිතව පැවතීම. |
| | | (iii) | වසරකට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා නොකිරීම |
| (ඈ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර නොගැනීම. |
| | | (ii) | අනුමැතියකින් තොරව හිඟ ආදායම් කපා හැරීම. |
| (ඉ) | ණයගැතියෝ සහ ණයහිමියෝ | (i) | වසර 5 ක් ඉක්මවූ ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් නොකිරීම. |